# මාළු පැටවුන්ගේ වික්‍රමය



සෙනුලි තිසංගා දසනායක

# මාළු පැටවුන්ගේ වික්‍රමය

සෙනුලි තිසංගා දසනායක

දිනය - 08 පෙබරවාරි 2025

ISBN - 978-624-208-283-7

# පිදුම

මා ආදරණීය දෙමව්පියන්, සහෝදර සහෝදරියන් සේම,

ගම රට සියළු දරුවන් හට සිප් සතර උගන්වා යහ මග

පෙන්වීම සඳහා සිය දිවිය කැප කරන උදාර ගුරු මව්පියන්

සැමට උපහාරයක් ලෙස.


# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එක ගෙදරක මාළු ටැංකියක් තිබුණා. ඒ මාළු ටැංකියේ ගොඩක් මාළු හිටියා. ඒ මාළුන්ගේ නම් තමයි ටෙට්ට්‍රා, ඒන්ජල්, ස්වෝඩ් ටේල්, රෝසි බාබ්, කාෆ්. තවත් මාළු ජාති ගොඩක් ඒ ටැංකියේ හිටියා. ටෙට්ට්‍රලා පාට ගොඩක් හිටියා. ඒ පාට තමයි රතු, නිල්, රෝස, කහ, කොළ, දම්, සුදු. තව මලාවි කියලා නපුරු මාළුවෙක් හිටියා. එයාට හැමෝම බයයි. ඒත් එක මාළු කට්ටියක් එයාට බය නෑ. එයාලගෙ නම තමා ටයිගර් බාෆ්. ඒ මාළු ටික සංගමයක් පටන් ගත්තා මලාවි ගෙන් බේරෙන්න. ඒ සංගමයේ ලොක්කෝ තමයි ටයිගර් බාෆ්ලා.



එක දවසක් මලාවි ටෙට්ට්‍රා කෙනෙක් පස්සෙන් පන්නන හැටි රෝසි බාබ් කෙනෙක් දැක්කා. එයා ඉක්මනට ගිහින් සංගමයේ අයට කිව්වා. සංගමයේ අය ඉක්මනට ගිහිල්ලා බැලුවා. ඒත් පරක්කු වැඩියි. එතකොටත් මලාවි ඒ මාළුවව කාලා ඉවරයි. සංගමයේ අය මාළු ටැංකි අයියාට ඒක ගැන පැමිණිලි කළා. මාළු ටැංකි අයියාට කිසිම දෙයක් කරන්න බැරි නිසා එයා "සලකා බලන්නම්" කියලා කිව්වා.


ටික දවසකින් මාළු ටැංකියට තවත් මාළුවෙක් ආවා. එයත් මලාවි කෙනෙක්. මලාවිලා දෙන්නා යාළුවෙලා මාළුන්ට කරදර කළා. දැන් මලාවිලා දෙන්නෙක් ම ඉන්න නිසා හැම මාළුවෙක්ම බයයි. ඒ වගේම ටයිගර් බාෆ්ලත් එයාලා දෙන්නට බයවෙලා. ඒ දෙන්නා එකතු වෙලා අනික් මාළුන්ව ටික ටික කෑවා.



මාස තුනක් විතර යද්දී මාළු ටැංකි අයියාට නාන්න ඕනි වුණා. මාළු ටැංකි අයියාට නාන්න ඕනි බව දැනගත්ත මාළු සංගමය මාළු ටැංකි අයියාගෙන් ඉල්ලුවා මලාවිලා දෙන්නව තනි තනියම ටැංකිවලට දාන්න කියලා. මාළු ටැංකි අයියාත් දන්නවා මේ දෙන්නගේ නරක වැඩ. ඒ නිසා මාළු ටැංකි අයියා ඒකට කැමති වුණා. ඊට පස්සේ මාළු ටැංකි අයියා මාළු ටැංකි මල්ලිලාට මාළු ටික බෙදලා දුන්නා. මාළු ටැංකි අයියා නාගෙන මලාවිලා ඇරෙන්න අනික් මාළු සේරම මාළු ටැංකියට ගත්තා. අනෙක් මාළු ටික බැලුවා කෝ මලාවිලා කියලා. එයාලට හිතාගන්න බැරි වුණ නිසා එයාලා ගිහිල්ලා මාළු ටැංකි අයියාගෙන් ඒ ගැන ඇහුවා. එයා කිව්වා අපි එයාලව ටික දවසක් තනි තනියම තියමු කියලා. එතකොට එයාලට තනිකම දැනිලා ඔයාලගෙන් සමාව අරගෙන ඔයාලට කරදර කරන්නේ නැතිවෙයි කියලා.

ඒත් මාළු ටැංකි අයියා කියපු දේ අහගෙන හිටපු මලාවිලා දෙන්නා හැදුනේම නෑ. ඒ නිසා මාළු ටැංකි අයියා එයාලා හැදෙනකම්ම එයාලව හිර කරලා තිබ්බා. එහෙම ඉඳලත් එයාලා හැදුනේම නෑ . ඒ නිසා මාළු

ටැංකි අයියා එයාලව ආපහු මාළු ටැංකියට ගත්තා. හැබැයි එයා අවවාද කළා ඔයාලා මාළුන්ට කරදර කළොත් ඔයාලාට පසුතැවෙන්න වෙයි කියලා. ඒක ගණන් ගත්තේ නැති මලාවිලා දෙන්න සාමාන්‍ය විදිහට මාළුන්ට කරදර කළා.




මාළු ටික ටික අඩුවන නිසා මාළු ටැංකි අයියා තවත් මාළු ගොඩක් ගෙනාවා. තවත් මාස තුනක් විතර යද්දී මාළු ටැංකි  අයියාට නාන්න ඕනි වුණා. මේ පාර එයාලට දඟලන්න බැරි වෙන විදිහට පොඩි මාළු ටැංකියකට දාන්න කියලා මාළු සංගමය මාළු ටැංකි අයියාගෙන් ඉල්ලුවා. මාළු ටැංකි අයියාටත් මේගොල්ලෝ මෙහෙම මාළුන්ව කන එක එපා වෙලා තියෙන්නෙ. ඒ නිසා මාළු ටැංකි අයියා ඒකට කැමති වුණා.

මලාවිලාව දැම්ම මාළු ටැංකියේ ඇතුලට ශබ්දය ගමන් කරන්නේ නෑ. ඒ නිසා මාළු ටික  කතා කරන කිසි දෙයක් මලාවිලාට ඇහෙන්නේ නෑ. එයාලව ඒ විදිහට අවුරුදු දෙකක් විතර තිබ්බා. එහෙම තිබ්බේ හැදුනේම නැති නිසා. ටික කාලෙකට පස්සේ මලාවිලා මාළු ටැංකි අයියාට කතා කරලා කිව්වා, "අපි මාළුන්ට කරදර කරන්නේ නෑ, අපි එයාලගෙන් සමාව ඉල්ලන්නම්, අපිට යන්න දෙන්න" කියලා.  මාළු ටැංකි අයියා හිතුවේ මාළු දෙන්නා දැන් හැදිලා ඇති කියලා.



මලාවිලා දෙන්නව මාළු ටැංකි අයියා මාළු ටැංකියට ගත්තා. මාළු පැංචෝ ටික හොඳටම බයවුණා. එයාලා ඒ මේ අත දුවලා ගිහිල්ලා හැංගුනා. හැබැයි මලාවිලා දෙන්නා දැන් වයස නිසා එයාලා පස්සේ දිව්වේ නෑ. මලාවිලා දෙන්නා ගිහිල්ලා මාළුන් ගෙන් සමාව ගත්තා. මාළු ටික එයාලට සමාව දුන්නා. ඒ උනාට මාළු තාම හිතන් ඉන්නේ මලාවිලා එයාලව කයි කියලා. එයාලා මලාවිලාගෙන් ටිකක් ඈත් වෙලා තමයි හිටියේ. ඒත් මලාවිලා මාළු කෑවේ නෑ. එයාලා හැදුවේ මාළු එක්ක යාළු වෙන්න.

තවත් මාසයක් විතර ගියා මාළු පැටවුන්ටත් තේරුණා මලාවිලා දෙන්නා එයාලව කන්නේ නෑ කියලා. ඒ නිසා මාළු ගිහිල්ලා මලාවිලා එක්ක යාළු වුණා. මාළු කිව්වා "ඔයාලා අපිට පොරොන්දු වෙන්න ඕනේ, අපිව කන්නේ නැහැ කියලා, අපිට කරදර කරන්නේ නෑ කියලා". "ඔයාලා ඒකට කැමති නම් අපි යාළුයි" කියලා. මලාවිලා දෙන්නා ඒකට කැමති වෙලා පොරොන්දු වුණා. ඊට පස්සේ මාළු සේරම යාළුවෙලා හැමෝමත් එක්කම සමගියෙන් සතුටෙන් ජීවත් වුණා.



ඒවගේම තව තව අලුතෙන් මාළු, මාළු ටැංකියට ආවා. අලුත් මලාවිලා ආවත් පරණ මලාවිලා දෙන්නා කිව්වා "ඔයාලා මාළුන්ට කරදර කරන්න එපා, එහෙම කළොත් ඔයාලට පසුතැවෙන්න වෙයි" කියලා. අලුත් මලාවිලා, පරණ මලාවිලාට බයවුණා. අලුත් මලාවිලා මාළුන්ට කවදාවත් කරදර කලේ නෑ. ඊට පස්සේ එන එන මාළු සේරම සමගියෙන් සතුටෙන් ජීවිතේ ගතකළා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්